# 75 වියට පා තබන
# ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය

භූගෝලීය පිහිටීම අතින් මෙන්ම සම්පත් අතින් සළකන කළ මේ දිවයින එද මෙන්ම අදත්, අද මෙන්ම හෙටත් කෘෂිකාර්මික රටක් වශයෙන්ම පවතිනු ඇත. වර්ග සැතපුම් 25,000 ක් පමණ වන භූමි ප්‍රදේශය එකිනෙකින් වෙනස් වන කෘෂි දේශගුණික කලාප වශයෙන් හඳුනාගත හැකිවූත්, විවිධාකාරයේ බෝග වගාවට සුදුසුවූත්, උසස් විභවයන්ගෙන් යුක්තවූත් පරිසරයන්ගෙන් සැදී ඇත. මෙවන් රටක ප්‍රධාන ජීවනාලිය කෘෂිකර්මය වී අදත් රටේ ජනගහනයෙන් 80% වත් වඩා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කෙළින්ම සම්බන්ධව පැවතීම අරුමයක් නොවේ.

රට තුළ පවතින කෘෂිකාර්මික විභවය නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම සාම්ප්‍රදායී පිළිවෙත තුළින් පමණක්ම ඉටුකර ගැනීමට සමත්වූ එකදු රටක් හෝ ඇතැයි සිතිය නොහැක. සාම්ප්‍රදායී ක්‍රම පවා විද්‍යාත්මක පදනමක පිහිටුවා ගෙන, නව අරමුණු ඔස්සේ වඩා ඉහළ කාර්යක්ෂමතාවක් ඉලක්ක කිරීම අද අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකාව තුළ එද ක්‍රියාත්මක වූ කෘෂිකාර්මික රටාව එද පැවති තත්වය යටතේ ප්‍රමාණවත් වුවද, සීඝ්‍රයෙන් වැඩිවූ ජනගහනයක අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට නව නිෂ්පාදන වේගයද ඊට අනුරූප සීඝ්‍රතාවයකින් වැඩි කිරීමේ අවශ්‍යතාවය වටහා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, කෘෂිකර්මයටත් විද්‍යාත්මක පදනමක් සකස් කරමින් ආරම්භ කරනු ලැබූ කෘෂිකාර්මික අධ්‍යාපන ක්‍රමය සැළකිය හැක.

කෘෂිකර්මයටම කැපවූ රටේ ජනතාවට නව විද්‍යාත්මක සොයා ගැනීම් බෙද – හද දෙන්නටත්, එවන් සොයා ගැනීම් ගොවිපලේ ක්‍රියාවට නැංවීමටත් අත්‍යාවශ්‍ය පියවරක් වශයෙන් මෙම කෘෂිකාර්මික අධ්‍යාපන වැඩ පිළිවෙල හැඳින්විය හැක. මේ අතින් 1916 වර්ෂයේදී තැබූ මුල් පියවර අද වනවිට අවුරුදු 75 ක් ඔස්සේ පසුකර ඇති ගමන් මඟ ජාතියකට ආඩම්බර විය හැකි අතීතයක් පමණක් නොව අනාගතයට පවා බලපාන මාවතක්ම වනු ඇත.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික නවෝදයේ කිඹිරිගෙය ලෙස සැළකිය හැකි පේරාදෙණිය රාජකීය උද්‍යානයේ තාවකාලික ගොඩනැගිල්ලක් තුළ මීට 75 වසරකට පෙර, 1916 දිනෙක, සර්ම කලාපීය කෘෂිකර්ම පාසැල (Tropical Agriculture School) වශයෙන් ජන්මය ලැබූ මේ පින්වත් කුමරිය ගතවූ වසර 75 ක් තුළ හැඩින් රුවින් වැඩී, මෝරා, අද වනවිට ජාතියට මහා මෙහෙවරක් කර හමාරය. එද තත්වය යටතේ ජාතික අවශ්‍යතාවයක් වශයෙන් සළකා නව කෘෂිකාර්මික දැනුම ජනතාව අතට පත්කරවීමේ කාර්යභාරය පැවරීමට සුදුසු වූවන් ලෙස අනාගත කෘෂිකාර්මික ගුරුන්, ගම් මුලාදෑනින් හා ගොවිකම් උපදේශකවරුන් පුහුණු කිරීමත්, ස්වයංව කෘෂිකාර්මික කටයුතු වල යෙදෙන්නට සූදනම් සිසුන්ට අවශ්‍ය දැනුම, හුරුව ලබාදීමත් ඉලක්ක කොට මෙම ආයතනය එද ආරම්භ කෙරින. ආරම්භ කළ වසරේදී පමණක් එක් අවුරුදු පාඨමාලාවකට සීමාවූ නමුදු, ඊළඟ වසරේ පටන් දෙවුරුදු පාඨමාලාවක තත්වයට වර්ධනය කොට මෙම පාඨමාලාව සංවර්ධනය වීමෙන් ඒ සඳහා එද වූ ඉල්ලුම වටහා ගත හැක. මේ සමඟම ගම් මුලාදෑනිවරුන්ගේ හා ග්‍රාමීය පාසැල් ගුරුවරුන්ගේ

විශේෂ අවශ්‍යතාවක් ඉටුකර ලීමට ගැලපෙන පරිදි එක් අවුරුදු පාඨමාලාව වෙන් වශයෙන් පවත්වාගෙන යනු ලැබීය.

වසර කිහිපයක් තිස්සේ ජාතියක අවශ්‍යතා ඉටු කරලමින් පවත්වාගෙන ගිය මෙම පාඨමාලාව තවදුරටත් සංවර්ධනය කිරීමේ අදහසින් 1921 දී මුල්වරට ස්ථිර ගොඩනැගිල්ලකට ගෙනයමින් තවත් පියවරක් තබා ඇත. අද පේරාදෙණියේ පශු රෝහල (එදා පශු රසායනාගාරය) වශයෙන් පවතින මේ ගොඩනැගිල්ල තුළදී එදා කෘෂිකර්මයට අදාල ශිල්පීය ඥානය බෙදදෙන අතරතුර, සිසුන්ගේ හුරුව වර්ධනයට පේරාදෙණියේ පර්යේෂණ මධ්‍යස්ථානයට ගොස් ඇත. ශ්‍රී ලංකාවේ කෘෂි-කාර්මික උන්නතිය උදා කිරීම ශත වර්ෂයක කාලයක් තුළ සම්පත් මෙහෙයවූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවැති විවිධ සම්පත් ඒකරාශී කරගෙන, මෙම අධ්‍යාපන පීඨයද දිනෙන් දින පියවරින් පියවර පා තැබුයේ ඉදිරියටමයි.

මේ උදර ගමනේ තවත් වැදගත් සන්ධිස්ථානයක් වශයෙන් 1941 වර්ෂයේදී සිදුවූ වෙනස්කම් සැළකිය හැක. මෙම ආයතනය සඳහාම වූ ගොඩනැගිලි, ගොවිපළ හා වෙනත් පහසුකම් සම්පූර්ණ කෙරී, වඩාත් දියුණු මට්ටමකින් ආයතනය පවත්වා ගැනීමට පියවර ගැනීම සැබෑ වෙනසක් වශයෙන් සැළකිය හැක. අංග සම්පූර්ණ දේශණශාලා පහසුකම්, රසායනාගාර පහසුකම්, පාසැල සඳහාම වූ ගොවිපළ පහසුකම් කෘෂිකර්ම පාඨමාලාව සඳහා සැළසුන අතරම, ආයතනයේ නමද කෘෂිකර්ම විද්‍යාලය වශයෙන් වෙනස් කරනු ලැබූයේද මේ අවස්ථාවේදීමය.

අද පේරාදෙණියේ ගන්නෝරුව ඓතිහාසික රණබිම මැද්දේ පිහිටි අක්කර 500ක පමණ රමණීය තැනිතලා භූමි භාගයක පිහිටි පර්යේෂණ ස්ථානයේ අක්කර 260 ක පමණ පර්යේෂණ කටයුතු වලට මෙන්ම ඉගැන්වීමේ කටයුතු වලටද යොදගත හැකිසේ වගාකළ රබර්, පොල්, කෝපි, කොකෝවා වැනි බෝගයද, අඹ, අලිපේර, කෙසෙල් වැනි පළතුරු බෝග වර්ගද, එළවළු බෝග වර්ග මෙන්ම වී වගාවෙන්ද යුක්ත විය. මේ සමඟම කිරි පට්ටි, කුකුල් කොටු, ඌරු ගාල්ද මෙම සංකීර්ණයටම ඇතුලත්ව තිබිණ. කාලයත් සමග ආයතනය ඉදිරියට යද්දී ලංකා විශ්ව විද්‍යාලයීය කෘෂිකර්ම පීඨයත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධව පිහිටුවා ගත් කමිටුවක් මගින් මෙම ගොවිපළේ කටයුතු සැළසුම් කෙරුන අතර, එහි කළමනාකාරිත්වය ඉටු වූයේ කෘෂිකර්ම විද්‍යාලයීය විදුහල්පති අතිනි.

මේ කාලයෙදීම සිදුවූ තවත් වැදගත් සිදුවීමක් නම්, කුණ්ඩසාලේ කාන්තාවන් සඳහා වෙන්වූ ගොවිකම් පාසැලක් විවෘත කිරීමට පියවර ගැනීමයි. 1948 දී මෙම ආයතනය විවෘත විය. මේ වනවිට ආරම්භයේදී තිබූ දෑවුරුදු පාඨමාලාව තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් බවට පරිවර්තනයවී තිබුණත්, එය වැඩිකල් නොගොස් දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් බවට ප්‍රතිවර්තනයවූ අතරම, ගුරුවරුන් හා ගම් මුලාදෑනීන් සඳහාවූ පාඨමාලාවද එතැනින් අහෝසි කරනු ලැබිණ. 1958 දී කුණ්ඩසාලේ කාන්තා ගොවිකම් පාසැල් භූමිය තුළම, ස්වභාෂා මාධ්‍යයන්ගෙන් අධ්‍යාපනය ලැබීමට හැකි පිරිමි දෙපක්ෂයටම ඇතුළත් විය හැකිසේ දෙවන කෘෂිකර්ම විද්‍යාලය ආරම්භ කෙරිනි. මෙවන විට පේරාදෙණිය කෘෂිකර්ම විද්‍යාලය පිරිමි සිසුන්ට පමණක් සීමාවී තිබූ අතර, 1966 දී මේ අතින් තවත් වැදගත් වෙනසක් සිදුවිය. පේරාදෙණිය හා කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාල දෙකම ඒකාබද්ධ කොට එක විද්‍යාලයක් බවට පත්විය. මේ සමඟම මෙතෙක් පැවැති සාමාන්‍ය ඩිප්ලෝමා පාඨමාලාව වෙනුවට භෝග වගාව, සත්ව පාලනය, කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව, උද්‍යාන විද්‍යාව හා ග්‍රාමීය ගෘහ පාලනය වශයෙන් ගෞරව පාඨමාල හැදෑරිය හැකි පරිදි සංශෝධිත පාඨමාල

ව්‍යුහයක් සකස් කෙරින. 1974 වන තෙක් මෙම ගෞරව පාඨමාලා ව්‍යුහය ක්‍රියාත්මකවූ අතර, එහිදී මතුවූ විවිධ ගැටළු හා ජාතික අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් ගෞරව පාඨමාලා ව්‍යුහය අතහැර යළිත් සාමාන්‍ය ඩිප්ලෝමා පාඨමාලාව පමණක් ස්ථාපනය කිරීමට පියවර ගැණුන.

කාලීන අවශ්‍යතා පදනම් කර ගනිමින්, ජාතික අවශ්‍යතා වලට අනුව ගමන් මහ තවදුරටත් වෙනස් වෙමින්, තවත් වැදගත් සිදුවීමක් 1981 වර්ෂය තුල කෘෂිකර්ම විද්‍යාලයීය ඉතිහාසයට එක්වේ. එනම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පැල්වෙහෙර හා අගුණකොලපැලැස්ස යන ස්ථාන දෙකේද දැවුරුදු සාමාන්‍ය ඩිප්ලෝමා සහතිකය පිරිනමන කෘෂිකර්ම විද්‍යාල දෙකක් විවෘත වීමයි.

---


කුන්ඩසාලේ ශ්‍රී ලංකා කෘෂිකර්ම විදුහලේ විදුහල්පති

(සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)

**කේ. එල්. ජයතිස්ස විසිනි**


---

මේ කාලය තුළ කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් වීම සඳහා වූ අවශ්‍යතා මෙන්ම ක්‍රියා පටිපාටියේද වෙනස්කම් සිදුවී, අද වනවිට මධ්‍යම මට්ටමේ තාක්ෂණික ශ්‍රේණියට ගැලපෙන අන්දමට ඇතුලත්වීමේ සුදුසුකම් තීරණය වී ඇත. ඒ සමඟම ඒ සඳහා විවෘත විභාගයක් පැවැත්වේ. මේ හැර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, තේ, රබර්, පොල් ව්‍යාප්ති අංශ වල හා සීනි සංයුක්ත මණ්ඩලය, මහවැලි සංවර්ධන මණ්ඩලය වැනි සංවිධාන වල සේවයේ යෙදෙමින් සිටින ක්ෂේත්‍ර නිළධාරීන්ටද ශිෂ්‍යත්ව ප්‍රදානය කරමින් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමටද අවස්ථාව සැලැස්වීන.

මෙම විද්‍යාල තුනේම අද මුළුමනින්ම වර්ෂයකට සිසුන් 250 ට පමණ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අවස්ථාව සැලසී ඇති අතර, කාන්තා සිසුන් ඇතුලත් කරගැනීම කුණ්ඩසාලේ විද්‍යාලයට පමණක් සීමා කෙරේ. නේවාසික පහසුකම් සහිත මෙම විද්‍යාල වල විෂය ධාරාවට, බෝග වගාව, සත්ව පාලනය, කෘෂි. ඉංජිනේරු විද්‍යාව, කෘෂි. රසායන විද්‍යාව කෘෂි. උද්භිද විද්‍යාව, බෝග ආරක්ෂණය, උද්‍යාන විද්‍යාව, ගොවිපල කළමනාකරණය, ව්‍යාප්ති ක්‍රමවේදය, කර්මාන්ත ශාලා වැඩ ( පිරිමි ) හා ගෘහ ආර්ථික විද්‍යාව ( කාන්තා ) යන විෂයයන් ඇතුළත් වේ. ඒ ඒ විෂයයම් අදාලව න්‍යායික දැණුමක් සමඟම ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් හුරුවද ලබාදීමට මෙ පාඨමාලා ව්‍යුහය සංවිධානයවී ඇත.

මෙම ආයතනයෙන් මෙතෙක් බිහි කෙරුන අති විශාල ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව දිවයිනේ විවිධ ක්ෂේත්‍ර වලට අනුබද්ධව, රාජ්‍ය අංශයේත්, පෞද්ගලික අංශයේත් විවිධ තරාතිරම් හොබවමින් කටයුතු කරන බව පෙනේ. මේ අතර කීප දෙනෙකු ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයින් වශයෙන් කීර්ති නාමයෙන් පුදණු ලැබීමට පවා සුදුස්සන්වීම ආයතනයේ අරමුණු මැනවින් ඉටුවීම පිළිබඳ සහතිකයකි. මේ සමඟ ස්වයංව කෘෂිකර්මය වෘත්තියක් බවට පත්කර ගෙන කටයුතු කරන අයද මොවුන් අතරවීම ආඩම්බරයට කරුණකි.